# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019-07-08 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : එච්.එම්.පී.එන්. ජයසුන්දර මයා,
අංක. 65/56 (41/36), තල්වත්ත,
මහනුවර.

වගඋත්තරකාර පාර්ශවයන් :

01. විදුහල්පති,
මහ/ ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

02. සභාපති,
අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

03. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

**<u>පැමිණිලි අංකය : HRC/K/695/17</u>**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මගින් සඳහන් කර ඇත්තේ, තම දරුවා 2018 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා කැඳවුම් අංක ආර්.එස්. 26 යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ බවත්, එහිදී තමාගේ නමට ඉඩමේ ඔප්පු නොමැති බැවින් කිසිම ලකුණක් ලබා නොදුන් බවත් 2017.11.27 දින පැවැති අභියාචනා පරීක්ෂණයේදී අභියාචනා මණ්ඩලය තමාගේ නිවසට ගෘහ අංක 2 ක් ඇති බැවින් ලකුණු ලබාදීමට නොහැකි බව දැන්වූ බවත්ය. 22/2017 චක්‍රලේඛනය අනුව පදිංචි ස්ථානයේ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. සභාපති / தவிசாளர் } 011-2505451 ෆැක්ස් / தொலைநகல் } 011-2505541 / 74 ඊමේල් / மின்னஞ்சல் } sechrc@gmail.com

හිමිකම තහවුරු කිරීමට ඔප්පුවක් නොමැති වුවද, ඔප්පුවට ලබාදෙන ලකුණු හැර අනෙකුත් ලේඛන සඳහා හිමි ලකුණු ලබාදියයුතු වුවත් අදාළ ලකුණු ලබා නොදීමෙන් තමන්ට බලවත් අසාධාරණයක් සිදුකර ඇති බැවින් සාධාරණයක් ඉටුකර දෙන ලෙසට මෙම පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවීය සැළකිරීම :-**

උක්ත පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවීය මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්ථාව මඟින් දන්වා ඇත්තේ, පැමිණිලිකරු තම දරුවා 2018 වර්ෂයේ මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත්වූ සම්මුඛ පරීක්ෂණයේදී 22/2017 චක්‍රලේඛනයට අනුව පාසලට ආසන්න ගණය යටතේ අයදුම් කිරීමේ මූලික සුදුසුකමක් වන හිමිකම් ඔප්පුව සම්බන්ධයෙන් නියමිත පරිදි ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බවත්, අභියාචනා සහ විරෝධතා කාලසීමාවේදී පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ අභියාචනා සලකා බලා අවශ්‍ය ලකුණු ලබාදීමට ගැටළුවක්ව පැවැති ගෘහ අංක දෙක සම්බන්ධයෙන් නගර සභාවෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ වෙනත් වගකිවයුතු ආයතනයකින් ලිපියක් ඉදිරිපත් කිරීමට අවස්ථා ගණනාවක් ලබා දුන්නද එය ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු අපොහොසත් වූ බවත් එබැවින් හිමිකම් ඔප්පුවට අදාළ ලකුණු හැර අනෙකුත් හිමි ලකුණු ලබාදීමට පැමිණිලිකරු නොපැමිණීම හේතුවෙන් අවසන් අවසන් ලැයිස්තුවේ නම සඳහන් වී නොමැති බවත්ය.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලි පාර්ශවය තම දරුවා 2018 වර්ෂයේ 1 වන වසර සඳහා මහනුවර ධර්මරාජ විද්‍යාලයට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්කර සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වී ඇත.

කැඳවුම් අංක ආර්.එස්. 26 යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ඇති අතර, සම්මුඛ පරීක්ෂණයේදී පදිංචිය සනාථ නොවීම මත ලකුණු 0 ක් පමණක් ලබාදීම හේතුවෙන් අභියාචනා හා විරෝධතා පරීක්ෂණයක් සඳහා 2017.11.27 දින පෙනී සිට ඇති බවත්, එහිදී පදිංචි ස්ථානයේ ගෘහ අංක 2 ක් තිබීම හේතුවෙන් එම ගෘහ අංක දෙකම එකම ස්ථානයක බව තහවුරු කරන ලෙස දන්වා ඇති බවත් නිරීක්ෂණය වේ.

2017.11.28 දින නැවත අභියාචනා හා විරෝධතා මණ්ඩලය ඉදිරියේ පෙනී සිට ඉල්ලා ඇති ගෘහ අංක දෙකම එකම ස්ථානයක බව තහවුරු කරන ග්‍රාම නිලධාරි වාර්ථාව ලබාගැනීමට පසුදින ග්‍රාම නිලධාරිගේ

රාජකාරි දිනය නොවන බැවින් ඒ සඳහා 2017.11.30 වන බ්‍රහස්පතින්දා දක්වා කාලය ලබාදෙන ලෙස ඉල්ලා ඇතත් ඒ සඳහා අවස්ථාව ලබාදී නොමැති බව නිරීක්ෂණය වේ.

ග්‍රාම නිලධාරි වර්තාවක් එක් දිනකින් ලබා ගැනීමට ප්‍රායෝගිකව හැකියාවක් නොමැති බැවින් ඒ සඳහා ප්‍රමාණවත් කාලසීමාවක් ලබාදීම යුක්තිසහගත නමුත් ඒ සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය වේ.

අදාළ ග්‍රාම නිලධාරි වාර්තාව ලබාදීම සඳහා පැමිණිලිකරුට ප්‍රමාණවත් කාලසීමාවක් ලබාදුන්නද එය ඉදිරිපත් කිරීමට පැමිණිලකරු අපොහොසත් වූ බව වගඋත්තර පාර්ශවීය වාර්තාවේ සඳහන් වුවද, එය තහවුරු කළහැකි කරුණු ඉදිරිපත් කර නොමැත.

පැමිණිලිකරුට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 0 ක් ලබාදීම සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය කොමිසම වෙත කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, හිමිකම් ඔප්පුවට අදාළ ලකුණු හැර අනෙක් හිමි ලකුණු ප්‍රමාණය ලබාදීමට පැමිණිලිකරු නොපැමිණි බවයි. එහෙත් පැමිණිලිකරුට ලකුණු ලබාදී ඇති ලේඛනයෙහි අභියාචනා මණ්ඩලය විසින් තබාඇති සටහනෙහි සඳහන් වන්නේ පැමිණිලිකරු " 2017.11.28 දින ලිපින දෙකම එකම ස්ථානයක බව සනාථ කිරීමට ලිපියක් රැගෙනවිත් නැත" යන්න හා "අංක 65/56 ලිපිනය අනුව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම ප්‍රතික්ෂේප කරන ලදී" යනුවෙනි. ඒ අනුව පැමිණිල්ලේ සඳහන් පරිදි පැමිණිලිකරු 2017.11.28 දින අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ නැවත පෙනී සිට ඇති බව නිරීක්ෂණය වේ.

තවද එහිදී ලිපින දෙකම එකම ස්ථානයක බව තහවුරු කිරීමට අදාළ ලේඛනයක් ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු අපොහොසත් වුවද, පැමිණිලිකරුගේ අභියාචනා සලකා බලා අනෙකුත් හිමි ලකුණු ලබාදීමට අවස්ථාව තිබී ඇති නමුත් ඒ සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය ක්‍රියාකර නොමැති බව නිරීක්ෂණය වේ.

2018.03.12 දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී වගඋත්තර පාර්ශවීය මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති ප්‍රකාශ කර ඇත්තේ අංක 22/2017 චක්‍රලේඛනයේ 7.1.3 වගන්තිය අනුව ඔප්පුව නොතිබුණද අනෙකුත් කොටස් සඳහා ලකුණු ලබාදීමේ හැකියාව තිබුනද අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2017.07.31 දිනැති අංක 22/2017 (1) උප වගන්තිය ඉවත් කර ඇති බැවින් අදාළ ලකුණු ප්‍රධානය කිරීමට නොහැකි වී ඇති බවයි.

එහෙත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ඊඩී/01/12/09/04/03 (i) හා 2017.09.17 දිනැතිව සියළුම පාසල්වල විදුහල්පතිවරුන් වෙත යොමුකොට ඇති ලිපිය මඟින් දන්වා ඇත්තේ, අංක 22/2017 (1) සංශෝධිත චක්‍රලේඛනය මඟින් අංක 22/2017 චක්‍රලේඛනයෙහි 7.1.3 උප වගන්තිය ඉවත්කර ඇතත් එහි

එක් එක් ගණයන් යටතේ නිර්ණායකයන්ට හිමිවන ලකුණු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ යුතුය යන්න එමඟින් ගම්‍ය නොවන බවයි. තවද එහි වැඩිදුරටත් සඳහන් වන්නේ යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණයෙන් ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප නොකළ යුතුය යන්නයි. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අධ්‍යාපන ලේකම්වරයාගේ උක්ත ලිපිය නිකුත් කිරීමට පෙර සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති බැවින් අංක 22/2017 චක්‍රලේඛනයෙහි 7.1.3 උප වගන්තිය අනුව සම්පූර්ණයෙන් ලකුණු ලබා නොදුන්නද අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට උක්ත ලිපිය අනුව ලකුණු ලබා දීමට හැකියාව තිබුණද පැමිණිලිකරුට කිසිදු ලකුණක් ලබා නොදීම මඟින් අධ්‍යාපන ලේකම්ගේ ඉහත කී ලිපියට පටහැනිව කටයුතු කරඇති බව නිරීක්ෂණය වේ.

එසේම <u>වෙනුර නන්විද සහ එස්.ටී කොඩිතුවක්කු</u> එරෙහිව <u>බී.ඒ අබේරත්න, විදුහල්පති, කොළඹ රාජකීය විද්‍යාලය **SC FR 62/2018**</u> නඩුවෙහි  පදිංචිය සනාථ කිරීමට නොහැකි වීම පදනම් කරගෙන ඉතිරි නිර්ණායක සඳහා ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම තුළින් පෙත්සම්කරුට අසාධාරණයක් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවී ඇති බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කොට ඇත.

තවද, <u>ශයනි ගීතිකා එරෙහිව දිසානායක **SC FR 35/2011**</u> නඩු තීන්දුවෙහි, පදිංචිය සනාථ කිරීම අව්‍යාජව ගොඩනැගීම සඳහා සමුච්චිතීය ප්‍රතිඵලයක් ලබාගැනීමට පළමු ශ්‍රේණිය සඳහා වූ අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති ලේඛන සියල්ල සුපරීක්ෂාකාරිව අධ්‍යයනය කළ යුතු බවට ප්‍රකාශ කර ඇත.

මෙම සියළු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැමිණිලිකරුට පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කිරීමට නොහැකිවීම මත ඊට අදාළ ලකුණු ප්‍රමාණය අහිමිවුවද සෙසු කොටස් සඳහාද කිසිදු ලකුණක් ලබා නොදීම හේතුවෙන් බලවත් අගතියක් සිදුකර ඇති බව තහවුරු වේ.

නිගමනය :-

පැමිණිලිකරුගේ ගෘහ අංක දෙකම එකම ස්ථානයක් බවට තහවුරු කිරීමට අවස්ථාව ලබා නොදීම හා පදිංචි ස්ථානයේ හිමිකමට අදාළ ලකුණු අහිමිවුවද අනෙකුත් කොටස් සඳහා හිමි ලකුණුද ලබා නොදී ලකුණු 0 ක් ලෙස සලකා පැමිණිලිකරුගේ දරුවා 2018 වර්ෂයේ 1 වන ශ්‍රේණිය සඳහා මහනුවර ධර්මරාජ විද්‍යාලයට තෝරා නොගැනීමෙන් වගඋත්තර පාර්ශවීය ධර්මරාජ විද්‍යාලයේ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය

යුත්තේය" යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති ලේඛන වලට හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය පැමිණිලිකරු වෙත ලබා දීමටත්, එම ලකුණු ප්‍රමාණය ආසන්නතා පදනම යටතේ පාසලට ළමුන් ඇතුළත් කරගැනීමේ කඩඉම් ලකුණු සීමාව කරා ප්‍රවිශ්‍ය වන්නේ නම් පැමිණිලිකරුගේ දරුවා මහ/ධර්මරාජ විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කර ගැනීමට පියවර ගත යුතු බවටත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. තවද චක්‍රලේඛනය ප්‍රකාරව කටයුතු නොකිරීම පිළිබඳව 1 වන හා 2 වන වගඋත්තර පාර්ශවය සම්බන්ධව පරීක්ෂණයක් සිදුකිරීමට ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුය.

2019.08.09 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :- අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මයා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/